# ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව
# තනතුරු - පුරප්පාඩු

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ යෝජිත කායවර්ධන මධ්‍යස්ථාන ව්‍යාපෘතියේ කටයුතු සඳහා එක් අවුරුදු කාලසීමාවකට කොන්ත්‍රාත් පදනම යටතේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | තනතුරු නාමය | තනතුරු | අවම සුදුසුකම් |
|---|---|---|---|
| 1. | කාය වර්ධන මධ්‍යස්ථාන උපදේශක | 02 | අ.පො.ස. (සා./පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ කුසලතා සහතික විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත්ව තිබීම |
| 2. | කාය වර්ධන මධ්‍යස්ථාන භාරකරු | 02 | අ.පො.ස. (සා./පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ කුසලතා සහතික විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත්ව තිබීම |
| 3. | කම්කරු | 04 | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය සමත්ව තිබීම |

ඉහත අංක 1 – 2 තනතුර සඳහා අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. ඉහත තනතුරු සඳහා රු. 11,730/= ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ. මීට අමතරව ජීවන වියදම් දීමනාව ද හිමිවේ.

**පොදු කොන්දේසි :**

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර, විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර තත්ත්වයකින් යුක්ත විය යුතුය.
2. වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.
3. දණ්ඩ නීති සංග්‍රහය යටතේ, වරදකට වරදකරුවන් වූ අය හෝ රාජ්‍ය සේවයෙන් / පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූ අය නොවිය යුතුය.

අයදුම්කරුවන් විසින්ම සකස්කරන ලද අයදුම්පත් 2009.10. 26 දිනට පෙර, ලැබෙන සේ *"නාගරික කොමසාරිස්, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව, රාජගිරිය"* යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම් කරන තනතුරු අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළයුතුය.

**ශාන්තා පී. ලියනගේ**
**නාගරික කොමසාරිස්,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව**

**2009. 10. 15 වන දින.**